# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2447/25 - 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා - 2025.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1984 අංක 7 දරන පනතින් සංශෝධිත 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 42 අ (1) වගන්තිය ප්‍රකාරව වූ සහතිකයයි**

*ලියාපදිංචි ලිපිනය* :- ඒ බී සී සී ෆීනික්ස් ෂිපිං (පුද්ගලික) සමාගම,
අංක 56, ශාන්ත ලූෂියස් වීදිය,
කොළඹ 13.

1984 අංක 7 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධිත) පනතින් (මෙහි මින් මතුවට ශ්‍රීලවඅ ලෙසට හඳුන්වනු ලබන) සංශෝධිත, 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ (මෙහි මින් මතුවට පනත ලෙසට හඳුන්වනු ලබන) 42 අ (1) වගන්තිය යටතේ එම අධිකාරිය වෙත පවරා ඇති බලතල මත හා ඒ ප්‍රකාරව ක්‍රියා කරමින් ශ්‍රී ලංකාවේ වලංගු නීතිය යටතේ ස්ථාපිත සමාගමක් වූ කොළඹ 13, අංක 56, ශාන්ත ලූෂියස් වීදිය යන ස්ථානයෙහි, සමාගමේ ලියාපදිංචි කාර්යාලය පවත්වා ගෙන යන්නා වූ ද, ඒ බී සී සී ෆීනික්ස් ෂිපිං (පුද්ගලික) සමාගම (සමාගම් ලියාපදිංචි අංකය PV92715) සමාගම ADQ, AB42, Greenhill Road, Peterhead, Scotland යන ලිපිනයේ සීමා සහිත ජී පී ෂිපින් සර්විසස් ලිමිටඩ් යන සමාගමේ නැව් නියෝජිතයා වශයෙන් මෙහි මින්මතු සවිස්තරව විස්තර කර ඇති මෙම සහතිකයට ඇතුළත් උපලේඛනයන් හි සඳහන් පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත 2022.12.31 දිනට අය විය යුතු ගාස්තු මෙම අධිකාරිය වෙත ගෙවීම ප්‍රතික්ෂේප කොට, අසමත් වූ සහ පැහැර හැර ඇති බවත්, එකී ඒ බී සී සී ෆීනික්ස් ෂිපිං (පුද්ගලික) සමාගමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත 2022.12.31 දිනට රුපියල් අනූ අට ලක්ෂ අසූදාස් හත්සිය හතළිස් නවයයි සත පනස් තුනයි (රු.9,880,749.53)ක සම්පූර්ණ මුදලක් අය විය යුතු ව ඇති බවත් මෙයින් සහතික කරයි.

උපලේඛනය

**2022.12.31 දිනට අධිහාරයෙන් තොරව ගෙවිය යුතු මුදල**

| *Invoice Date* | *Invoice Number* | *Invoice Amount* | *Balance Due (Sri Lanka Rupees)* |
|---|---|---|---|
| 08 Jun 2022 | 22- NS - 002786 | 4,060,217.50 | 3,352,271.02 |
| 16 Jun 2022 | 22- NS - 002881 | 3,619,585.55 | 3,619,585.55 |
| 20 Jun 2022 | 22- SO - 006086 | 1,443,482.07 | 1,443,482.07 |
| 25 Jul 2022 | 22- NS - 003444 | 1,465,410.89 | 1,465,410.89 |
| **Total outstanding (without surcharges)** | | | **9,880,749.53** |

ඒ බී සී සී ෆීනික්ස් ෂිපිං (පුද්ගලික) සමාගම විසින් 2022.12.31 දිනට අධිහාරයෙන් තොරව රුපියල් අනූඅට ලක්ෂ අසූදාස් හත්සිය හතලිස් නවයයි සත පනස් තුනයි (රු. 9,880,749.53) ක මුදලක් අය විය යුතු බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහතික කරයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොදු මුද්‍රාව, වර්ෂ 2025ක් වූ ජූලි මස 08 වැනි දින, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ ඉදිරියේ දී මෙයට තබනු ලබන අතර එලෙස මුද්‍රා තැබීම ඔවුන් විසින් අත්සන් කර සහතික කරනු ලැබේ.

.......................................
සභාපති

.........................................
කළමනාකාර අධ්‍යක්ෂ.

EOG 07 - 0355